**ශීර්ෂය - 265, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම**

-----------------------------------------------------

**විගණකාධිපති වාර්තාව- 2013**

-------------------------------------

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(i) මහජනතාවට පහත සදහන් සේවාවන් සැපයීම හෝ එම සේවාවන් ඒ හා සම්බන්ධ ආයතනවලින් ලබා ගැනීමට සම්බන්ධීකරනය කිරීම.

- විදේශ ගමන් බලපත්, ජාතික හැදුනුම්පත්, ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකපත්, උපත් මරණ හා විවාහ සහතික, මෝටර් රථ ආදායම් බලපත්‍ර ආදිය නිකුත් කිරීම.
- ඡන්ද නාම ලේඛණ පවත්වා ගෙන යාම හා ලබා දීම.
- බලපත්‍ර, ඉඩම් හිමිකම් ඔප්පු ලබා දීමට කටයුතු කිරීම හා ඉඩම් පිළිඹද ගැටළු නිරවුල් කිරීම.
- දිස්ත්‍රික්කයේ වෙසෙන වැඩිහිටියන්ට හා ආබාධිත පුද්ගලයින්ට මාසික ආධාර ලබා දීම.
- ජන ප්‍රජාවගේ මානසික සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සදහා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම. (උපදේශන සේවා)
- සේවා ව්‍යුක්ති කණ්ඩායම් හා කාන්තාවන් ගෘහමූලික වශයෙන් පවතින පවුල් සවිබල ගැන්වීම හා පුහුණු කිරීම.

(ii) සමස්ථ අරමුණ සාක්ෂාත් කර ගැනීම සදහා යහපත් මූල්‍ය ගනුදෙනු ක්‍රමයක් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාම.

(iii) දිස්ත්‍රික්කයේ සිටින ප්‍රජාවන්ගේ කලා සංස්කෘතික හා සදාචාරකම් දිරිගැන්වීම සදහා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

(iv) දිස්ත්‍රික්කයේ පවතින සම්පත් කාර්යක්ෂමව යෙදවීමට සැළසුම් සම්පාදනය කිරීම.

(v) ආපදාවන්ගෙන් මහජනතාව ආරක්ෂා කිරීම

(vi) දිස්ත්‍රික්කය සම්බන්ධ මූලික දත්ත රැස්කර පවත්වාගෙන යාම.

(vii) ප්‍රාදේශීය තිරසාර සංවර්ධනය බල ගැන්වීම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) මන්නාරම

(ආ) නානාටන්

(ඇ) මුසාලි

(ඈ) මාන්තයි බටහිර

(ඉ)   මඩු

## 1.2 විගණන විෂය පථය

මන්නාරම  දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත් ,  ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ,  අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත . එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය,  මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,  අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,  149,  150 හා 152 ව්‍යවස්ථාවන්ට හා අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම,  පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම,  ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණයන්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව,  මෙම වාර්තාවේ (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.6 සිට 1.12 දක්වා වූ ඡේදවල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් ඇතිවන බලපෑම හැර මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

**(අ) පොත්පත් හා ලේඛන පවත්වා නොතිබීම**

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් විගණන නියැදි පරික්ෂණ වලදී නිරික්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| උප පත්‍රිකා ලේඛණ | මු.රෙ. 341 | පවත්වා නොතිබුණි. |
| චෙක්පත් තැපැල් කිරීමේ ලේඛණ | මු.රෙ.388 | -එම - |
| පොත් නාමාවලිය | මු.රෙ. 45 | -එම - |
| ස්ථාවර වත්කම් ලේඛණ | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | -එම - |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

විගණනයට ලබා ගැනීමට හැකි වූ තොරතුරු පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකල රු. 147,253,054 ක් වටිනා ගෙවීම් වවුචර් 372 ක් අස්ථාන ගතවී තිබුණි.

**(ඇ) විසර්ජන ගිණුම**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.167,953,792 ක් වූ අතර**,** සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.167,283,65**3** ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම්

කාර්යාලයේ ශුද්ධ ඉතිරි කිරීම් රු.670,139 ක් එනම් 0.4 ක ප්‍රතිශතයක් විය. විස්තර පහත දැක්වේ.

2013 දෙසැම්බර් 31 දිනට

| වියදම් | ශුද්ධප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරියමුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 145,253,792 | 144,978,611 | 275,181 | 0.2 |
| මූලධන | 22,700,000 | 22,305,042 | 394,958 | 1.7 |
| එකතුව | **167,953,792** | **167,283,653** | **670,139** | **0.4** |

(ii) **අයවැය විචලනය**

මුදල් රෙගුලාසි 94 අනුව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සළසා නොතිබුනොත් මිස වියදමක් හෝ බැදීමක් හෝ නොකළ යුතුයි. කෙසේ වුවද, වාර්ෂික ඇස්තමේන්තුවල සළසා තිබූ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් 8ක් වෙනුවෙන් රු.1,593,836 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

(ii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 17 ක් හා දෙපාර්තමේන්තු 14 ක් විසින් එකතුව පිළිවෙලින් රු.223,124,234 කින් සහ රු. 454,564,490 කින් සමන්විත එකතුව රු. 677,688,724 ක්වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එයින් පිළිවෙලින් රු. 212,071,126 කින් සහ රු.434,874,540 කින් සමන්විත රු.646,945,666 ක මුදලක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව වර්ෂ අවසාන වන විට පිළිවෙලින් රු.11,053,108 ක් හා රු.19,689,950 ක් වශයෙන් එකතුව රු.30,743,058 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය පිළිවෙලින් සියයට 5 ත් සියයට 4.3 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම, වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| 26501 | 12,000,000 | 7,630,897 | 6,000,000 | 7,846,179 | 50,000,000 | 36,160,294 |

පහත නිරික්ෂණය කරනු ලැබේ.

2013 වර්ෂය අවසාන වන විට අයවීම් හිගහිට වීමට තිබූ ශේෂ වල එකතුව රු.295,926 ක් විය. එම ශේෂයේ පිළිවෙලින් 1992, 1996 හා 2001 වර්ෂවල සේවය අතහැර ගිය නිලධාරින් තුන් දෙනෙකුගෙන් අය කළ යුතුව තිබු රු.713,000 ක මුදලක් ද, 2008 වර්ෂයේ වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගෙන් අය කල යුතුව තිබූ රු. 31,305ක ණය ශේෂයක්ද, 2009 වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අය කර ගැනීමට තිබූ රු. 56,408ක මුදල සහ 1998 හා 2000 වර්ෂවලදී මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුට අදාල රු.136,910ක එකතු ශේෂයක්ද ඇතුලත් වී තිබුණි.

(ඉ) **අග්‍රිම ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 7002/0/0/283/13 දරන අග්‍රිම ගිණුමේ රු.79,500ක බැර ශේෂයක් පැවතුණි. එසේ වුවද භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.15,420,500 ක් විය. වෙනසට හේතුන් විගණනයට පැහැදිලි කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිම කල විගසම ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කල යුතු වුවත් කාර්ය නිමවී දින 26 ක සිට දින 161ක කාල පරාසයක් ප්‍රමාදයකින් පසුව රු. 527,450 ක අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුනි.

**(ii)** නිශ්චිත කාර්යයන්හී තථ්‍ය වියදම ඇස්තමේන්තු නොකර අවස්ථා 6 කදී රු. 84,000 ක අත්තිකාරම් ලබා දී තිබුනි. මේ හේතුවෙන් සියයට 46 සිට සියයට 73 දක්වා වූ පරාසයකින් යුත් රු. 45,918ක අත්තිකාරම් දීර්ඝ ප්‍රමාදයකින් පසුව මුදලින් නිරවුල් කර තිබුණි.

**(iii)** මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව පෙර ලබා ගත් අත්තිකාරම් නිරවුල් කිරීමකින් තොරව කිසිදු අළුත් අත්තිකාරමක් ලබා නොදිය යුතු වුවද මුදල් රෙගුලාසියෙහි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස පෙර අත්තිකාරම් නිරවුල් කර නොතිබුනු අවස්ථා 13 කදී රු. 114,000ක අත්තිකාරම් නොකඩවා ගෙවා තිබුණි.

**(iv)** 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2012 නොවැම්බර් 20 දිනැති අංක 5/2012 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල ගිණුම් පියවීම පිනිස වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකු පත් කර නොතිබුණි.

**(ඊ)** **පොදු තැන්පත් ගිණුම**

--------------------------

2013 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.52,679,435 ක් වූ අතර විස්තර පහත දැක්වේ.

| ගිණුම්අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| **6003/0/0/41** | **52,679,435** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වර්ෂ දෙකක් ඉක්මවූ රු. 6,482,792ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ii)** 2012 හා 2013 වර්ෂයන්හී විවිධ කාර්යයන් සඳහා තැන්පත් කර තිබූ රු.18,126,213ක් වූ තැන්පත් 2014 ජූලි 31 දක්වා එම කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණි.

**(iii)** 2011 සිට 2013 දක්වා වූ කාලය තුල මාර්ග බලපත්‍ර ලබා දීමෙන් ලැබී තිබූ රු.1,766,601ක මුදල් අදාල ආයතනය වෙත ප්‍රේෂණය නොකර 2014 ජූලි 31 දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 1.6 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---

### 1.6.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

---

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්මක් 2014 ජූලි 31 දක්වා පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රෙල්ඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 ජූලි 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.3 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන වැඩසටහනක් හා විගණන සැලැස්මක් 2013 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණු අතර 2013 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණනයට ලබා දී නොතිබුණි.

**1.6.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මකකිරීම**

---------------------------------------------------------

භාණ්ඩාගාර ලේකම්ගේ 2000 ජූනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් හෝ පැවැත්විය යුතු වුවත් එවැනි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂයේදී එක්වරක් පමණක් පවත්වා තිබුණි.

**1.7** වත්කම් කළමනාකරණය

--------------------------------

**(අ)** නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක සංඛ්‍යාව | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| මෝටර් රථ | 06 | වර්ෂ 02 |
| යතුරු පැදි | 01 | වර්ෂ 02 |
| වායු සමීකරන | 02 | වර්ෂ 02 |
| රූපවාහිනි යන්ත්‍රය | 02 | වර්ෂ 02 |
| ලැප්ටොප් පරිගණක යන්ත්‍රය | 02 | වර්ෂ 02 |
| දූවිලි පිරිපහන් පිරිසිදු කරන යන්ත්‍රය | 01 | වර්ෂ 02 |
| වතුර පොම්ප | 01 | වර්ෂ 02 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක් සමීක්ෂණ මණ්ඩල පවත්වා අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඉකුත් වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා 2013 ජූලි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම වාර්තා හා ඉන්වෙන්ට්‍රි ලේඛණ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) මුදල් රෙගුලාසි 758(2) ප්‍රකාරව ගොඩනැගිලි වල ඇති අයිතම් කිහිපයක් තෝරා ගෙන තොග ගැණුම් කරු විසින් ඒවා ඉන්වෙන්ට්‍රි ලේඛණ වල නිවැරදිව සටහන් කර ඇති බවට පුද්ගලිකව සෑහීමට පත් විය යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ii) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මන්නාරම, මුසලි, මඩු සහ මාන්තෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වල හදුනාගෙන තිබු භාවිතයට ගත නොහැකි ගබඩා අයිතම් වර්ග 173, 91, 231, සහ 122 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශව වෙත දී ඇති වත්කම්**

(i) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.2 වගන්තියට පටහැනිව අතිරේඛ දිස්ත්‍රික් ලේකම්ගේ නිල නිවස 2013 ජනවාරි සිට ප්‍රාදේශීය අඩවි වන නිලධාරි වෙත ලබා දී තිබූණු අතර ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.7 වගන්තිය ප්‍රකාරව කුලී අයකිරීමකින් තොරව අවිධිමත් පරිදි අඩවි වන නිලධාරියාගේ මූලික වැටුප පදනම් කරගෙන එම දිනයේ සිට කුලී අය කර ගෙන තිබුණි. තවද 2014 අගෝස්තු වන විට රු.34,702ක කුලී අය කර ගෙන නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අවිධිමත් පරිදි වාහන 6ක් භාහිර පාර්ශව වෙත මුදා හැර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ලියා පදිංචි අංකය | වාහන වර්ග | භාහිර පාර්ශවය |
|---|---|---|
| 53 – 5435 | පිකප් රථ | මන්නාරම නගර සභාව |
| 52 – 5084 | පිකප් රථ | තරුණ සේවා සභාව, මන්නාරම |
| WP - JQ – 1512 | ටොයොටා හයිලක්ස් රථ | කාර්මික සංවර්ධන මණ්ඩලය, මන්නාරම |
| WP - JQ – 1477 | ටොයොටා හයිලක්ස් රථ | කෘෂිකර්ම |

| | | |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුව |
| WP - HM – 6896 | ඉසුසු ටී.එෆ්. එස් .4 එච්. | ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය, මන්නාරම |
| NP - MV – 0560 | යතුරු පැදිය | ප්‍රාදේශීය සභාව, මන්නාරම |

**1.8 අනුකූල නොවීම්**

-----------------

**නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

--------------------------------------------------

විගණන නියැදි පරික්ෂණ වලදී නිරික්ෂණය වු නීති,රීති, හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) මුදල් රෙගුලාසි 139(1) සහ 257 | 773,634 | බලය ලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද ගෙවීම් වවුචර් මගින් පමණක් ගෙවීම් කල යුතු වුවද රු.773,634ක ගෙවීම් සහතික නොකරන ලද ගෙවීම් වවුචර් 14 ක් මගින් සිදු කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 206(1) , (4) | 197,768 | තැන්පත් ගිණුමෙන් කරනු ලබන ගෙවීමට අදාල සෑම ගෙවීම් වවුචර් පතක්ම නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කල යුතු වූවත්, මෙම විධි විධානයට පටහැනිව ගෙවීම් වවුචර් 7ක් මගින් රු.197,768ක ගෙවීම් කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 237(ආ) | 100,090 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ක් විසින් අවස්ථා 9 කදී මිලදී ගෙන තිබූ භාණ්ඩ ලබා ගෙන තිබුනේද යන්න නහවුරු කිරීම සඳහා ගබඩා සහතිකපත් ලබා දී නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | කෙසේ වුවද ඒ සඳහා රු.100,090 ක ගෙවීමක් සිදු කර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 880 සහ 881 | 428,500 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක සේවයේ නිරත වී සිටින නිලධාරීන් 43 දෙනෙකුගෙන් සහ රියදුරන් 3 දෙනෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුනි. |
| (v) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | මාස 06 කට වරක් වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතුය. කෙසේ වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක් යටතේ පවතින බොහෝ වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (vi) 2008 ජූනි 26 දිනැති අංක13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8 වැනි වගන්තිය | 61,113 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයකට අදාල මාසික සාරාංශ වාර්තා 2013 ජූලි සිට දෙසැම්බර් මාසය දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| (vii) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමණාකරන සේවා චක්‍රලේඛ හා 2011 ජනවාරි 24 දිනැති අංක එච්ජ්/ඒඩීඩී/එස්ඊසී/17/පොදු දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | | අනියම් හෝ ආදේශක පදනම යටතේ බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. කෙසේ වුවද, එම විධිවිධානයට පටහැනිව මඩු ප්‍රාදේශීය ලේකම් විසින් 2009 පෙබරවාරි 18 දින වැඩ ආදේශක පදනමකින් කම්කරුවෙකු බඳවා ගෙන විගණන දිනය වූ 2014 ජූලි 31 දක්වා වැටුප් ගෙවා තිබුණි. |

## 1.9 කොන්ත්‍රාත් පාලනය

සමාලෝචිත වර්ෂයේදී රු.3,200,000ක වියදමක් දරා වගා ලිං 32ක් ඉදි කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් ලබා ගත යුතු අනුමැතිය ලබා නොගැනීමේ අරමුණින් ලිං 32ක සමස්ථ ඉදිකිරීම් වැඩ කොටස් දෙකකට බෙදා ග්‍රාමීය සංවර්ධන සමිති දෙකකට ලබා දී තිබුණි.

(ii) ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමකින් තොරව වගා ලිං ඉදි කිරීම් සඳහා වූ ඇස්තමේන්තු වගකිව යුතු නිලධාරියෙකු විසින් සකස් කර තිබුණි. එම ලිං වල ජලය නොතිබීම හේතුවෙන් මහජනතාවට ඒවා භාවිතයට ගත නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් එකී ලිං ඉදි කිරීම සඳහා වැය කර තිබූ රු.3,200,000 ක මුදල නිෂ්ක්‍රීය වියදමක් වී තිබුණි.

## 1.10 අවිධිමත් ගණුදෙනු

### ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැර වීම

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:2 මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත තරගකාරී මිල කැඳවීම් පිළිපැදීමකින් තොරව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2:7:7 සහ 2:8:5 මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසු ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කිරීමකින් තොරව දිවි නැගුම වැඩසටහන යටතේ රු. 2,030,000 ක වියදමක් දරමින් පළතුරු පැළ 21,650ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණි. මුදල් රෙගුලාසි 237 (ආ) අනුව භාණ්ඩ ලබා ගෙන තිබුණේද යන්න තහවුරු කිරීම සඳහා සහතිකයක් නොතිබුණද රු. 2,030,000ක මුදලක් ඒ සඳහා ගෙවා තිබුණි.

(ii) 2006 මාර්ගෝපදේශයේ 2:14:1 මාර්ගෝපදේශ විධිවිධානයට පටහැනිව මිල ගණන් 5 ක් වෙනුවට මිල ගණන් 3 ක් පදනම් කරගෙන මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යෞවන සේවා මධ්‍යස්ථානය සඳහා රු. 970,000 ක මුදලකට ක්‍රීඩා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

## 1.11 පාඩු හා හානි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම අනුව අවස්ථා 4කට අදාලව රු. 2,760,000ක පාඩු හා හානි අවුරුදු 10 කට වඩා වැඩි කාලයක සිට පැවති එන අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 113 හී විධි විධාන ප්‍රකාරව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි**.**

**1:12** **මානව සම්පත් කළමනාකරණය**

අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2013 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදිවේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 16 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 35 | 11 | 24 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 317 | 224 | 93 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 35 | 18 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික) | - | 20 | - | 20 |
| | එකතුව | 426 | 306 | 140 | 20 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරපුපාඩු 140ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අපොහොසත් වී තිබුණි**.**

(ii) බඳවා ගෙන තිබුණු අනියම් හා තාවකාලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි**.**